## ඔබ වාහක වුවත් ඔබේ විවාහක සහකරු සහකාරිය වාහක නොවන අයෙකු නම් . . .

බිය වීමට කිසිදු කාරණයක් නොමැති අතර, ඔබේ දරුවන් වාහක නොවන දරුවන් හෝ වාහක දරුවන් වේ. ඔබේ දරුවාගේ වයස අවුරුද්ද සම්පූර්ණ වූ පසු තැලසීමියා රුධිර පරීක්ෂණය සිදුකර ගන්න.

## ඔබ සහ ඔබගේ විවාහක සහකරු සහකාරිය වාහක අයෙකු නම් . . .

දෙමාපියන් දෙදෙනාගෙන්ම තැලසීමියා ජාන දරුවාට උරුම විය හැකි බැවින්, මහා තැලසීමියා රෝගී දරුවෙකු ලොවට බිහි විය හැක. එබැවින්, වෛද්‍ය උපදෙස් ගැනීම වැදගත් වේ.




## ඔබ සිතට ගත යුතු දේ . . .

- තැලසීමියා වාහකයෙකු යනු රෝගියෙකු නොවේ.
- තැලසීමියා වාහක දරුවෝ වාහක නොවන දරුවන් සේ සාමාන්‍ය පරිදි වර්ධනය වේ.
- තැලසීමියා රෝගී දරුවන් බිහිවීම වැලැක්විය හැකිය.

## ඔබේ යුතුකම . . .

- වයස අවුරුදු 12 ට වැඩි සියලු දෙනාම තැලසීමියා වාහක පරීක්ෂණය සඳහා යොමු කරන්න.
- ඔබ තැලසීමියා වාහක අයෙකු නම්, විවාහය සඳහා වාහක නොවන අයෙකු තෝරා ගන්න.




වැඩි විස්තර සඳහා -

ජාතික තැලසීමියා නිවාරණ වැඩසටහන
බෝ නොවන රෝග කාර්යාංශය
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
කොළඹ 10.
දුරකථන: 0112686393


Towards a Healthy Lifestyle


මුද්‍රණය: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව




# තැලසීමියාවෙන් තොර ශ්‍රී ලංකාවක්

### තැලසීමියා රෝගය පිළිබඳව ඔබ දැනගත යුතු දේ සහ ඔබගේ වගකීම

## තැලසීමියාව යනු කුමක් ද?

- උපතින්ම ඇතිවන, රුධිරයේ රතු රුධිරාණුවල හිමෝග්ලොබින් නිපදවීමේ ඌණතාවක් නිසා හටගන්නා රෝගී තත්ත්වයකි.
- මෙය පරම්පරාවෙන් දෙමව්පියන්ගේ ජාන මාර්ගයෙන් දරුවන්ට උරුම වේ.
- තැලසීමියාවේ ප්‍රභේද 02 කි. එය තැලසීමියා වාහකයන් සහ තැලසීමියා රෝගීන් වශයෙනි.

## තැලසීමියා වාහක තත්ත්වය යනු ...

- දෙමව්පියන්ගෙන් එක් තැලසීමියා ජානයක් පමණක් උරුම වූ විට එය තැලසීමියා වාහක තත්ත්වය ලෙස හඳුන්වයි.
- එවිට රුධිරයේ හිමොග්ලොබින් (Hb) මට්ටම තරමක් අඩු විය හැකි නමුදු එය රෝගී තත්ත්වයක් ලෙස නොසැලකේ.
- තැලසීමියා වාහක තත්ත්වය ශරීරයේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයට හා වර්ධනයට බලපෑමක් ඇති නොකරයි.
- තැලසීමියා සම්බන්ධ විශේෂ රුධිර පරීක්ෂණයකින් පමණක් වාහක තත්ත්වය තහවුරු කර ගත හැකිය.
- ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 4% ද වයඹ පළාතේ ජනගහනයෙන් 8% පමණ ද තැලසීමියා වාහකයන් වේ.
- තැලසීමියා වාහකයන් දෙදෙනෙකු අතර සිදුවන විවාහයක දී, මහා තැලසීමියා රෝගී දරුවකු ඉපදීමට හැකි බැවින්, විවාහයට පෙර ඔබගේ වාහක තත්ත්වය නිශ්චය කරගන්න.

## තැලසීමියා රෝගී තත්ත්වය යනු . . .

- මව සහ පියා දෙදෙනාගෙන්ම තැලසීමියා ජාන උරුම වූ විට දරුවාට තැලසීමියා රෝගය වැළඳේ.
- මෙය ජීවිත කාලය පුරාවටම බලපාන රෝගයකි.
- අධික සුදුමැලි බව, අක්මාව සහ ප්ලීහාවේ ඉදිමීම මෙහි ප්‍රධාන රෝග ලක්ෂණ වන අතර, පළමු මාස 4-8 තුළ මෙම ලක්‍ෂණ මතු වේ.
- පිටතින් රුධිරය ලබාදීම ප්‍රධාන ප්‍රතිකාර ක්‍රමය වන අතර, මෙය මසකට වරක් ජීවිත කාලය තුළදීම ලබා දිය යුතුය.
- රුධිරය ලබා දීම නිසා ශරීරයේ යකඩ එකතු වීම ඇතුළුව මෙම රෝගයේ සංකූලතා නිසා, මෙවැනි දරුවන් රැක බලා ගැනීමේ දී ආර්ථික, සාමාජීය සහ මානසික ගැටලු රැසකට මුහුණ දීමට දෙමාපියන්ට සිදු වේ.
- මේ නිසා තැලසීමියා රෝගී දරුවෙකු ඇතිවීම වැලැක්වීම ඉතා වැදගත් ය.

## තැලසීමියා වාහක තත්ත්වය තහවුරු කර ගැනීමට

- සම්පූර්ණ රුධිර සෛල ගණනය කිරීමේ පරීක්ෂණය (FBC) සහ රුධිර පටක පරීක්ෂාව (Blood Picture) මගින් රෝගය හඳුනාගන්නා අතර, HPLC/CE පරීක්ෂණය මගින් වාහක තත්ත්වය තහවුරු කළ හැකිය.
- තැලසීමියා වාහක නොවන අය සඳහා හරිත පතක් ද (Green Card) වාහක අය සඳහා රෝස පතක් ද (Pink Card) ලබා දේ.

